**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව - 2016**

**-----------------------------------------------**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සහ එහි පරිපාලිත සමාගමක් වන සී/ස ලංකා සිමෙන්ති සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ඒකාබද්ධ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2017 ඔක්තෝබර් 11 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**

**----------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැළපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 මතය ව්‍යාචනය - සමූහය**

**------------------------------**

මෙම වාර්තාවේ 2.2.1 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**මතය ව්‍යාචනය - සංස්ථාව**

**------------------------------**

මෙම වාර්තාවේ 2.2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------------------

### 2.2.1 සමූහයේ අඛණ්ඩ පැවැත්ම

----------------------------

සංස්ථාවේ ප්‍රාග්ධනය රු.මිලියන 967 ක් වූ අතර, සමුච්චිත අලාභය රු. මිලියන 676 ක් විය. සංස්ථාවේ පැවැත්මට බලපෑමක් ඇතිවී නැතත්, සීමාසහිත ලංකා සිමෙන්ති සමාගම දිගින් දිගටම අලාභ ලබා තිබීම හේතුවෙන් ඒකාබද්ධ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය අනුව රු.මිලියන 3,045 ක සමුච්චිත අලාභයක් ලබා තිබුණු අතර ප්‍රාග්ධනය රු.මිලියන 2,702 ක් විය. ඒ අනුව කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 112.7 ක් ඛාදනය වී ඇති බව නිරීක්ෂණය වූ අතර එම හේතුවෙන් භාණ්ඩාගාරයේ සහාය නොමැතිව සීමාසහිත ලංකා සිමෙන්ති සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.

### 2.2.2 සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------------------

#### 2.2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

--------------------------------

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37**

-----------------------------

ප්‍රමිතයේ 86 වගන්තිය අනුව ආයතනයේ අසම්භාව්‍ය බැරකම් පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කළ යුතු වුවත්, සංස්ථාව විසින් 2016 දෙසැම්බර් 31 දිනට උසාවියේ විභාග වෙමින් පවතින නඩු 15 ක් සම්බන්ධයෙන් ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

#### 2.2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සිමෙන්ති විකුණුම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීමේදී එකතුව රු.600,360 ක ජාතිය ගොඩනැගීමේ බදු ද ඇතුළත් දල විකුණුම් වටිනාකම සටහන් කිරීම නිසා වර්ෂයේ දල අලාභය එම වටිනාකමින් අඩුවී තිබුණි.

(ආ) සිමෙන්ති සංස්ථාවට අයත් පුත්තලම ප්‍රදේශයේ පිහිටි ඉඩමක් හොල්සිම් ලංකා සමාගමට කුලියට දී තිබූ අතර, කුලී ගිවිසුම් කාලය අදාල වර්ෂයේ මැයි සිට ඊළඟ වර්ෂයේ ජූනි මාසය දක්වා විය. ඒ අනුව 2015/2016 වර්ෂ සඳහා ලැබූ රු.121,000 කුලී ආදායම 2015 වර්ෂයේ ආදායමක් ලෙස මුදල් පදනමට ගිණුම් තැබීම නිසා 2016 වර්ෂයේ කුලී ආදායම රු.50,416 ක් අඩුවෙන් සටහන් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ ජූනි සිට දෙසැම්බර් දක්වා වූ රු.70,584 ක ලැබිය යුතු ආදායම් මුදලක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) පුත්තලම අරුවක්කාලු ඉඩමේ හුණුගල් නිධිය සම්බන්ධව තාක්ෂණික අධ්‍යයන කටයුතු සඳහා භූමියට ප්‍රවේශ වීමේ ගාස්තු ලෙස පෞද්ගලික ආයතනයකින් ලැබී තිබූ රු.321,900 ක වටිනාකමින් රු.31,900 ක් එකතු කළ අගය මත බදු සඳහා ලැබීම් වන අතර එම එකතු කළ අගය මත බදු ලැබීම්ද විවිධ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2012 වර්ෂයේ ගෙවූ ආර්ථික සේවා ගාස්තු මුදලින් ඉදිරියට ගෙන යා නොහැකි රු.1,065,027 ක මුදල රඳවාගත් ලාභ ගිණුමට හර කළ යුතු වුවද, සංස්ථාව විසින් එය සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හර කර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2010 වර්ෂයේදී සංස්ථාව සතු තෙල් ටැංකි ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට බදු පදනම මත ලබාදී තිබුණි. ඒ අනුව 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සංස්ථාවට අයවිය යුතු මුළු බදු මුදල රු. මිලියන 84.6 ක් විය. එම ලැබිය යුතු ආදායම් ගිණුම්ගත කර නොතිබුණු අතර, එම ආදායම් 2016 වර්ෂය අවසාන වන විටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සංස්ථාව සතු කන්කසන්තුරේ පිහිටි තෙල් ටැංකි සංකීර්ණය සහ ඉඩමේ අයිතිය ලිඛිතව තහවුරුවී තිබුණද, 1989 වර්ෂයෙන් පසුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මෙම වත්කම් ඇතුළත් කර නොතිබුණි.

(උ) පුත්තලම දිස්ත්‍රික්කයේ පාලවිහී සංස්ථාව සතුව පවතින අක්කර 221 ක් වූ ඉඩමෙන් අක්කර 152 ක් පමණක් තක්සේරු කර ගිණුම්ගත කර තිබුණද, ඉතිරි අක්කර 69 තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

-----------------------------------

ආයතනය විසින් පවත්වාගනු ලබන බැංකු ජංගම ගිණුමක් වෙනුවෙන් පරිගණක ආශ්‍රයෙන් පවත්වාගනු ලබන මුදල් පොත අනුව 2016 දෙසැම්බර් 31 දිනට රු.2,654,122 ක් ශේෂයක් පැවතියද අතින් ලියන ලද මුදල් පොත අනුව එම ශේෂය රු.1,106,032 ක් වූයෙන් රු.1,548,090 ක වෙනසක් නිරීක්ෂණය විය. 2008 වර්ෂයේ සිට පවතින එම වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කිරීමකින් තොරව පරිගණකගත මුදල් පොතේ ශේෂය පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණි.

**2.2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම ගිණුම් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| බැංකු ණය | 56,293,352 | ණය ලිපිගොණු හා උපලේඛන |
| ලැබිය යුතු තැන්පත් | 859,437 | ශේෂ සනාථන ලිපි |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ රු.89,212,053 ක් වූ අතර, එම ශේෂ තුළ වසර 1 සිට වසර 3 දක්වා රු.11,010,343 ක් සහ වසර 3 ඉක්ම වූ රු.57,988,878 ක ශේෂයන් විය. මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වෙළඳ ශේෂ රු.46,502,068 ක් වූ අතර, එම ශේෂ තුළ වසර 1 සිට වසර 3 දක්වා රු.13,180,262 ක් සහ වසර 3 ඉක්ම වූ රු.30,086,483 ක ශේෂයන් විය. එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සංස්ථාව විසින් 2014 සහ 2015 වර්ෂ වලදී අවස්ථා 13 කදී මාස 02 කින් ගෙවීමේ පදනම මත සංස්ථාව සතු ඉඩම ඇපයට තබා කෙටිකාලීන ණය මුදලක් රාජ්‍ය බැංකුවකින් ලබාගෙන තිබුණි. එම ණය මුදල 2015 සැප්තැම්බර් 15 දින වන විට ගෙවා අවසන් කළ යුතු වුවද 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.56,293,352 ක් ගෙවිය යුතුව පැවතුණි.

(ඈ) සංස්ථාව විසින් ලබාගත් බැංකු ණය වෙනුවෙන් වාරික හා පොළිය නිසි පරිදි නොගෙවීම නිසා පොළී සඳහාද පොළී ගෙවීමට සංස්ථාවට සිදුවී තිබුණි. ඒ අනුව පූර්ව වර්ෂවල ලබාගත් බැංකු ණය සහ ඊට අදාළ පොළී මුදල් වල එකතුව රු.42,000,000 ක් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත කෙටිකාලීන ණය ගිණුමකට මාරු කර තිබූ අතර, 2016 දෙසැම්බර් 31 දිනට එම ණය ගිණුමේ නොපියවූ ශේෂය රු.17,500,000 ක් විය.

(ඉ) අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව, අන්තර් ජාතික සමාගමකට ගෙවිය යුතු ණය මුදලක් පියවීම සඳහා රාජ්‍ය බැංකුවකින් 2012 වර්ෂයේදී රු.40,000,000 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. 2013 වර්ෂයේ සිට වර්ෂ 5 ක් තුළ සමාන වාරික 5 කින් එම ණය මුදල ගෙවා අවසන් කළ යුතු වුවද නිසි පරිදි වාරික මුදල් නොගෙවීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට එම මුළු ණය මුදලින් ගෙවිය යුතු මුළු ණය වටිනාකම රු.24,000,000 ක් විය.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 396 | බැංකු ජංගම ගිණුම් 02 කට අදාළ එකතුව රු.1,116,485 ක වටිනාකමට නිකුත් කර ඇතත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් 09 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර චෙක්පත් අවලංගු කර තිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 4.2.6 වගන්තිය | කාර්යසාධන වාර්තා මාස තුනකට වරක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කළ යුතු අතර, කාර්තුව අවසන් වීමට දින 30 කට පෙර එම වාර්තාව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | විවිධ කාර්යයන් සඳහා ලබාදෙන ලද එකතුව රු.1,388,569 ක අත්තිකාරම් මුදල්, හඳුනාගෙන පියවීමට කටයුතු කිරීමකින් තොරව තවදුරටත් මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර තිබුණි. |

| | |
|---|---|
| (ඈ) 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සංස්ථාව සතු කන්කසන්තුරේ පිහිටි තෙල් ටැංකි සංකීර්ණයෙහි වටිනාකම රු.2,624,338 ක් වන ඉඩම්, ගොඩනැගිලි, ලී බඩු හා උපකරණ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.31,700,843 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.2,583,617 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.29,117,226 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ දළ අලාභය රු.7,906,665 කින්, එනම් සියයට 77.4 කින් අඩුවී තිබීම සහ අනෙකුත් ආදායම් රු.31,498,348 කින්, එනම් සියයට 52.46 කින් වැඩිවී තිබීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අඛන්ඩව ශුද්ධ අලාභ ලබා නැවතත්, 2015 සහ 2016 වර්ෂයේදී පිළිවෙලින් රු.2,583,617 ක් සහ රු.31,700,843 ක ශුද්ධ ලාභ තත්ත්වයක් ඇති වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය, රජයට ගෙවූ බදු සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු සංස්ථාවේ දායකත්වය, 2012 වර්ෂයේදී රු.26,165,135 ක ධන අගයක් වූ අතර, 2013 වර්ෂයේදී රු.338,370,664 ක ඍණ අගයක් ගෙන තිබුණි. 2014 සහ 2015 වර්ෂවලදී දායකත්වය ධන අගයක්ව පැවති අතර, 2016 දී රු.70,978,162 ක ධන අගයක්ව පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

1959 ජනවාරි 2 දිනැති අංක 11634 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව සිමෙන්ති නිෂ්පාදනය, ආනයනය කිරීම හා අලෙවි කිරීම, සිමෙන්තියෙන් නිෂ්පාදිත භාණ්ඩ අලෙවිය හෝ සිමෙන්ති කොන්ක්‍රීට් ඇතුළත් දුරකථන සහ විදුලි රැහැන් කණු, දුරකථන කුටි, ජලය ගෙන යන උපකරණ, හියුම් නල සහ ටයිල් නිෂ්පාදනය කිරීම, විද්‍යුත් බලශක්තිය තොග වශයෙන් සැපයීම සංස්ථාවේ ප්‍රධාන අරමුණු විය.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිමෙන්ති නිෂ්පාදනය කර අලෙවි කිරීම සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන කිරීම සංස්ථාවේ ප්‍රධාන අරමුණු වුවත්, පසුගිය යුධමය වාතාවරණය තුළ කන්කසන්තුරේ සිමෙන්ති නිෂ්පාදනය නතර වීමත් සමඟ, වර්තමානය වන විට සිමෙන්ති මලු ආනයනය කර අලෙවි කිරීම සහ කොන්ක්‍රීට් නිෂ්පාදන අලෙවිය දක්වා ආයතනයේ මූලික කාර්යය සීමා වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සමඟ කාර්යසාධන වාර්තාව සැසඳීමේදී සත්‍ය ක්‍රියාකාරීත්වය සන්සන්දනය කළ හැකි පරිදි එම වාර්තාව පිළියෙල කර නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළදී රු.107,858,978 ක් වටිනා සිමෙන්ති අලෙවි කිරීමට සැලසුම් කර තිබුණද, ආයතනයේ මූල්‍ය දුෂ්කරතා වලට මුහුණ දීම නිසා කාර්යසාධන වාර්තාව අනුව අලෙවි කර තිබුණේ රු.63,030,000 ක් වටිනා සිමෙන්ති පමණි. ඒ අනුව ලබා කරගත් කාර්යසාධනය අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 41.56 ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොන්ක්‍රීට් කණු සහ බ්ලොක් ගල් නිෂ්පාදනය කර අලෙවි කිරීමෙන් රු.2,408,000 ක ආදායමක් උපයා තිබුණද, ක්‍රියාකාරී සැලැස්මේ අදාළ ඉලක්ක සටහන් කර නොතිබුණි.

(ඉ) සංස්ථාව පිහිටුවීමේ මූලික අරමුණ සිමෙන්ති නිෂ්පාදනය කර අලෙවි කිරීම වුවත්, 2016 ඔක්තෝබර් 20 දිනැති අංක PE/RES/VRS – 1 – 2016 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසුව රටේ ක්ලින්කර් නිධියන්හි භාරකාරත්වය සංස්ථාවට පවරා තිබුණු හෙයින් සංස්ථාවේ ඉතිරි සේවකයින් 14 දෙනා යොදවාගෙන බදු කුලිය නිර්ණය, කන්කසන්තුරේ ඇතුළු ඉතිරි ඉඩම් සඳහා බදුදීම සහ බදු ගිවිසුම් යාවත්කාලීන කිරීම ආදී කටයුතු සිදුකර එම ආදායමෙන් සේවක පාරිශ්‍රමික ගෙවීමෙන් අනතුරුව ඉතිරි මුදල් රජයට ප්‍රේෂණය කිරීම යන කාර්ය සංස්ථාව වෙත පවරා තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ සිමෙන්ති සහ සිමෙන්ති නිෂ්පාදන අලෙවිය තුළින් 2016 වර්ෂය තුළ එකතුව රු.2,304,013 ක දළ අලාභයක් ලබා තිබුණි.

(ආ) 1967 ජූලි 12 දිනැති අංක 14756/7 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය සහ අංක 288 දරන ඔප්පුව මගින් කොල්ලුපිටියේ පිහිටි පර්චස් 89.9 ක ඉඩම සංස්ථාවට හිමිවී තිබුණි. 2008 වර්ෂයේදී ලංකා බැංකුවෙන් රු.172,000,000 ක උපරිම ණය සීමාවක් යටතේ ණය ලබා ගැනීම සඳහා මෙම ඉඩම බැංකුවට උකස් කර 2016 දෙසැම්බර් 31 දිනට රු.97,793,352 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. ඒ සඳහා ගෙවිය යුතු පොළිය රු.21,767,910 ක් වූ අතර, බැංකුවට ගෙවිය යුතු මුළු ණය හා පොළී මුදල රු.119,561,262 ක් විය. මේ අනුව මූල්‍ය දුෂ්කරතා මත සංස්ථාව ඉඩම නිරවුල් කර ගැනීමේ අවධානමක් පැවතුණි.

(ඇ) සංස්ථාව විසින් රු.1,200,000 කට මිලදී ගන්නා ලද ගාල්ල උණවටුන කැස්බෑපාන පිහිටි අක්කර 06 ක ඉඩම ආයතනයේ අවසරයකින් තොරව ගාල්ල ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සුනාමියෙන් විපතට පත්වූවන් නැවත පදිංචි කිරීම සඳහා භාවිතා කර තිබුණි. එම ඉඩම සඳහා වන්දි මුදල් ලබාගැනීම සඳහා ගාල්ල දිසා අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවතුණි.

(ඈ) සංස්ථාව සතු කන්කසන්තුරේ පිහිටි තෙල් ටැංකි සංකීර්ණය ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට බදු දුන් බව ප්‍රකාශ කළද, 2016 වර්ෂය හා ඉදිරි වර්ෂ සඳහා එම සමාගම හෝ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ කිසිදු ලිඛිත ගිවිසුමකට සංස්ථාව එළඹී නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කන්කසන්තුරේ පිහිටි සිමෙන්ති කර්මාන්තශාලාව සහ ගොඩනැගිලි සංකීර්ණය පිහිටි භූමිය අක්කර 741 ක් වූ අතර, එයින් අක්කර 297 ක් ගැසට් නිවේදනයක් මගින් සංස්ථාව වෙත පවරා තිබුණි.ඉතිරි අක්කර 444 ක ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර නොතිබූ අතර, හිමිකාරිත්වය පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලද අතර, මෙම මෙම කර්මාන්තශාලාව, ගොඩනැගිලි හා ඉඩම් අධි ආරක්ෂිත කලාපයේ යුධ හමුදාව භාරයේ දීර්ඝ කාලයක සිට නිෂ්ක්‍රීය වත්කමක් ලෙස පැවතුණි.

(ආ) පුත්තලම දිස්ත්‍රික්කයේ පාලවිහී සංස්ථාව සතුව පවතින අක්කර 221 ක් වූ ඉඩමෙන් අක්කර 209 ක් ඵලාදායී කාර්යයක යෙදවීමට කළමනාකරණය පියවර ගෙන නොතිබුණි.

**4.4 ආර්ථික නොවූ ගණුදෙනු**

සංස්ථාව විසින් 1981 වර්ෂයේ සිට සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වල රු.1,083,618,910 ක් ආයෝජනය කර තිබුණද, 2016 වසර දක්වා කිසිදු ප්‍රතිලාභයක් සංස්ථාවට සමාගමෙන් ලබාදී නොතිබුණි.

**4.5 හඳුනා ගන්නා ලද පාඩු**

2009 අංක 16 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත අනුව පිරිවැටුම කාර්තුවකට රු. මිලියන 50 ක් හෝ ඊට වැඩි නම් පමණක් ආර්ථික සේවා ගාස්තු සඳහා බැඳීමක් ඇති වේ. 2013 හා 2014 වර්ෂ දෙක වෙනුවෙන් 2015 වර්ෂයේදී රු.54,191,154 ක් පමණක් ලැබී තිබියදී එම ආදායම පදනම් කරගෙන රු.163,388 ක් ආර්ථික සේවා ගාස්තු ගෙවීම් කර තිබුණි. එම මුදල අදාළ නිලධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද 2016 වර්ෂයට අදාළ රු.27,399,370 ක කුළී මුදල පදනම් කරගෙන රු.129,211 ක් ආර්ථික සේවා ගාස්තු ලෙස වෙන් කර තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

සංස්ථාවේ 2016 ජනවාරි 01 දිනට අනුමත කාර්ය මණ්ඩලය 76 ක් විය. 2016 ජූලි 31 දින ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමයක් මගින් සේවකයින් 36 දෙනෙකු විශ්‍රාම ගොස් තිබූ අතර 2016 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 14 දෙනෙකුට සීමාවී තිබුණි. ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වීමෙන් පසු සංස්ථාව වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය අනුමත කරවාගෙන නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සංස්ථාවේ 2016 වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2017 ජූනි 20 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 5.2 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය අනුව සංයුක්ත සැලැස්මේ ඇතුළත් විය යුතු ආයතනයේ සංවිධාන සැලැස්ම, මානව සම්පත් හා කළමනාකරණ දක්ෂතා සහ පසුගිය වර්ෂ 03 ක මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය යන ප්‍රධාන කරුණු ඇතුළත් කර නොතිබුණි.

(ආ) උක්ත චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන පිටපත් අයවැය ලේඛනය සමඟ රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහ භාණ්ඩාගාරය හා විගණකාධිපති වෙත එක් එක් මූල්‍ය වර්ෂයක් ආරම්භ වීමට අවම වශයෙන් දින 15 ට පෙර ඉදිරිපත් කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

## 5.3 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය අනුව, සැලසුම්ගත කාලපරිච්ඡේදය තුළදී සපුරාගත යුතු අරමුණු හා ඉලක්ක පිළිබඳව කළමනාකරුවන්ගේ වගකීම ක්‍රියාකාරී සැලැස්මේ පැහැදිලිව දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වන විට ආයතනයේ ප්‍රධාන අරමුණ, කිලෝ ග්‍රෑම් 50 පෝට්ලන්ඩ් සිමෙන්ති මළු ආනයනය කර බෙදාහැරීම ලෙස දක්වා තිබුණද, සංයුක්ත සැලැස්මේ සහ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර තිබූ ඉලක්කගත වටිනාකම් අතර රු.2,858,978 ක වෙනසක් පැවතුණි.

## 5.4 අභ්‍යන්තර විගණනය

සංස්ථාවේ 2016 වර්ෂයේ පළමු අර්ධ වර්ෂය තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණද එක් නිලධාරිනියක් පමණක් අනුයුක්ත කර තිබුණි. පළමු අර්ධ වර්ෂය තුළ විගණන විමසුම් නිකුත් කර නොතිබූ අතර, එම නිලධාරිනියද 2016 ජූලි සිට ස්වේච්ඡා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමය මගින් විශ්‍රාම ගොස් තිබුණි. මෙම හේතුව මත 2016 දෙසැම්බර් 31 දින වන විට අභ්‍යන්තර විගණන අංශය සම්පූර්ණයෙන්ම අක්‍රියව පැවතුණි.

## 5.5 විගණන කමිටු

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය අනුව කැඳවුම්කරු ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණක සමඟ අවම වශයෙන් මාස 03 කට වරක් විගණන කමිටුව බැගින් වර්ෂයක් තුළ විගණන කමිටු 04 ක් පැවැත්විය යුතු වුවත්, සංස්ථාව විසින් 2016 වර්ෂය තුළදී විගණන කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 5.6 ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව 2016 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**5.7 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 08 ක අයවැයගත හා තත්‍ය වියදම්වල සියයට 43 සිට සියයට 971 දක්වා විචලනයන් පැවති අතර, අයවැය ඇස්තමේන්තු අනුමත කර ගැනීමකින් තොරව පුනරාවර්තන වැය විෂයයන් 11 ක් වෙනුවෙන් එකතුව රු.18,925,523 ක වියදම් දරා තිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.8 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය අනුව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත අවසාන විගණිත ගිණුම් සමඟ විගණන වාර්තා භාෂාත්‍රයෙන්ම පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2015 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා 2017 ජූලි දක්වා අමාත්‍යාංශය වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.

**5.9 නොවිසඳී ඇති විගණන ඡේද**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ණය පදනම මත සිමෙන්ති විකිණීම සඳහා අලෙවි නියෝජිත ධුරය ප්‍රදානය කිරීමේදී ණය පදනම මත ලබාදෙන වටිනාකමට සරිලන ඇප බැඳුම්කරයක් ලබා නොගැනීම හා ණය ලබාදීමේදී සහ ණය එකතු කිරීමේදී කළමනාකරණය විසින් විධිමත් හා කාර්යක්ෂම ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එකතුව රු.52,506,824 ක් වූ ණය ශේෂ අයකරගෙන නොතිබුණි.

(ආ) පුත්තලම දිස්ත්‍රික්කයේ, අරුවක්කාලු ප්‍රදේශයේ පිහිටි අක්කර 5352 ක් වූ හුණුගල් නිධිය 1995 වර්ෂයේදී සිමෙන්ති නිෂ්පාදනය සඳහා හුණුගල් කැණීම් කිරීමට පෞද්ගලික සමාගමකට වසර 50 ක කාලසීමාවකට බදු දී තිබුණි. බදු ගිවිසුම අනුව සමාලෝචිත වර්ෂයේදී අයකරගත යුතු වාර්ෂික කුළිය ඇ. ඩො. 202,804 කට සමාන රු.26,851,358 ක වටිනාකමක් විය. කෙසේ නමුත්, ඇතිකරගෙන තිබූ බදු ගිවිසුමේ වාර්ෂික බදු කුළිය සංශෝධනය කිරීම පිළිබඳ වගන්තියක් ඇතුළත් කර නොතිබීම හේතුවෙන් 2011 අගෝස්තු 16 දින පැවති පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී මෙම බදු ගිවිසුම සංශෝධනය කිරීමට උපදෙස් ලබාදී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබූ අතර, මෙම ඉඩම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ගැනීමටද කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ආයතනයේ ලෙජර් ගිණුම්, පොත්පත් හා ලේඛන යාවත්කාලීනව පවත්වා නොගැනීම.<br>(ii) ආයතනය විසින් ප්‍රධාන ජර්නලයක් පවත්වා නොතිබීම. |

| | | |
|---|---|---|
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | (i) වත්කම් ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම<br><br>(ii) සමීක්ෂණ මණ්ඩල පත් කිරීම සහ සමීක්ෂණයන් කිරීම ප්‍රමාද කිරීම. |
| (ඇ) | ගබඩා පාලනය | සිමෙන්ති තොග නඩත්තු කිරීම, ගබඩා කිරීම සහ තොග වාර්තා පවත්වා ගැනීම සම්බන්ධයෙන් නිසි අවධානය යොමු නොකිරීම. |
| (ඈ) | අභ්‍යන්තර පාලනය | (i) අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දීමටත්, ඒවා නිසි පරිදි ක්‍රියාත්මක කර පාලනයන් පවත්වා ගැනීමට කටයුතු නොකිරීම.<br><br>(ii) අභ්‍යන්තර විගණන අංශයක් නොමැති වීම |
| (ඉ) | ණයගැති හා ණය හිමි පාලනය | (i) හිඟ ණය ශේෂ අයකර නොගැනීම.<br><br>(ii) ගෙවිය යුතු ශේෂ පියවීමට කටයුතු නොකිරීම. |